www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයට එරෙහි සසජාශි/සසප හදිසි සම්මේලනය විසින් ශ්‍රී ලංකාවේ සසප සාමාජිකයා අතුරුදහන් වීම ගැන සම්මත කරන ලද යෝජනාව

## Resolution adopted by the ISSE/SEP Emergency Conference Against War on the disappearance of SEP member in Sri Lanka

**2007 අප්‍රේල් 6**

*මාර්තු 22 දා සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් උතුරු ශ්‍රී ලංකාවේ නාවික මාර්ග බාධක දෙකක් අතර ගමන් කරමින් සිටිය දී අතුරුදහන් විය. ඔවුන්ගේ අතුරුදහන් වීමෙන් සති දෙකකට පසුවත් ශ්‍රී ලංකාවේ ආන්ඩුව සහ මිලිටරිය ඔවුන්ගේ ඉරනම පිලිබඳව මුනිවත රකිමින් සිටී. ඔවුන් අත් අඩංගුවට ගැනීම සහ සමහර විට ඝාතනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආන්ඩුව වගකිව යුතු යැයි විශ්වාස කිරීමට සෑම හේතුවක් ම පවතී. පසු ගිය අගෝස්තුවේ දී සසප ආධාරකරුවකු වූ සිවප්‍රකාශම් මරියදාස් ඔහුගේ නිවසේ දී ඝාතනය කරන ලදි.*

*පහත පල වන යෝජනාව, මිචිගන්හි ඈන් ආබර් සරසවියේ දී 2007 මාර්තු 31 හා අප්‍රේල් 1 දිනවල සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ/සමාජවාදී සමානතා පක්ෂය පැවැත්වූ යුද්ධයට එරෙහි හදිසි සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලදි.*

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් මාර්තු 22 දා උතුරේ යාපන අර්ධද්වීපයේ දී අතුරුදහන් වීම පිලිබඳව පූර්න වාර්තාවක් සැපයීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුව ක්‍රියා කල යුතු යැයි මෙම සම්මේලනය ඉල්ලා සිටී. පුංගුඩුතිව් දිවයින හා ඔවුන් දෙදෙනා ජීවත් වන කයිට්ස් දිවයින යා කරන දිග මුහුදු පාලම දෙපස ඇති නාවික මාර්ග බාධක දෙකක් අතර දී සිදු වූ මෙම අතුරුදහන් වීම සම්බන්ධයෙන් මිලිටරිය ඍජුවම වගකිව යුතු ය නැත හොත් එයට සම්බන්ධ බවට සෑම සාක්ෂ්‍යයක් ම පවතී. විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ ඉරනම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආන්ඩුව වගකිව යුතු යැයි කියා සිටින අපි ඔවුන් වහාම හා ආරක්ෂිතව නිදහස් කිරීම සහතික කරන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටිමු.

පසු ගිය අගෝස්තු 7 දා නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ මුල්ලිපොතනේ පිහිටි ඔහුගේ නිවසේ දී සසප ආධාරකරුවකු වූ සිවප්‍රකාශම් මරියදාස් ඝාතනය කිරීම ගැන බැරෑරුම් පරීක්ෂනයක් පවත්වා එම ඝාතනය සිදු කල අයට එරෙහිව නඩු දමන ලෙස ද මෙම සම්මේලනය ආන්ඩුවෙන් ඉල්ලා සිටී. අට මසක් ගත වීමෙන් පසුවත් මෙම අපරාධය සම්බන්ධයෙන් කිසිවකුට චෝදනා ඉදිරිපත් කිරීමට හෝ අත් අඩංගුවට ගැනීමට පොලීසිය අපොහොසත් වීම බලගතු ලෙස යෝජනා කරන්නේ එයට වගකිව යුතු පාර්ශ්වය, ඝාතනයෙන් පසුව මරියදාස් එල්ටීටීඊ සාමාජිකයකු බවට බොරු කටකතා පතුරුවා හල මිලිටරිය හෝ ඔවුන් සමග සහයෝගීව ක්‍රියා කරන පැරා-මිලිටරි කන්ඩායම්වලින් එකක් බව යි.

ඔවුන් යුද්ධයට දැක්වූ විරුද්ධත්වයත් සෑම ආකාරයක ම වර්ගවාදී දේශපාලනයන්ට එරෙහිව ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමට ඔවුන් ගෙන ගිය අරගලයත් හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයට සහ මෙම පුද්ගලයන්ට එරෙහිව සිදු කල දේශපාලන අපරාධ ලෙස මෙම අතුරුදහන් කිරීම් හා ඝාතනය මෙම සම්මේලනය හෙලා දකී.

* * *

මෙම දෙදෙනා සම්බන්ධයෙන් ඔවුන් අත පවතින සියලු තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ බලධාරින් වෙත වහාම ලිපි යවන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සිය සියලු පාඨකයන්ගෙන් ඉල්ලා සිටී.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක ලේකම්,
15/5, බාලදක්ෂ මාවත,
කොලඹ 3, ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094-11-2541529.
ඊ-මේල්: secretary@defence.lk

එන්.ජී. පුංචිහේවා,
අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,
අංක 36, කින්සි පාර,
කොලඹ 8, ශ්‍රී ලංකාව,
ෆැක්ස්ඃ 0094-11-2694924.

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ. ශ්‍රී ලංකාව,
ඊ-මේල්ඃ wswscmb@sltnet.lk

© www.wsws.org